චක්‍රලේඛ අංක :- 02/2006

මගේ අංකය:- බප/සසේකො/ලේ.නිර්/2006
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2006.02.06

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
ග්‍රාමීය බැංකු සංගම් හා ස.ණ.ස. සමිති සභාපතිවරුන්
වෙත.

**විධිමත් විනය පරීක්ෂණවලදී පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම.**

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2004.11.25 දිනැති අංක 06/2004 දරණ චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

02. 1972 අංක 12 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ සම්පාදිත රෙගුලාසි මාලාවේ 93 වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල සහ වෘත්තීය සමිති විසින් කරන ලද ඉල්ලීමක්ද සලකා නිකුත් කරන ලද එකී චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය කිරීමෙන් තොරව පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම සිදුකරනු ලබන අවස්ථා ඇති බව කොමිෂන් සභාවට පෙනී ගොස් ඇත.

03. ඒ අන්දමින් සමිති අධ්‍යක්ෂ මණ්ඩල විසින් මේ වන විටත් පරීක්ෂණ නිලධාරීන් පත් කර ඇතොත්, නොපමාව එම තත්වය විධිමත් කර ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත කරුණු දක්වන ලෙසත්, එසේ නොවුවහොත් අභියාචක මට්ටමේදී කොමිෂන් සභා නියෝගයන්ට පටහැනිව කළ විධිමත් පරීක්ෂණ ලෙස සලකා ක්‍රියා කිරීමට සිදුවිය හැකි බවත් මෙයින් දැනුම් දෙමි.

04. මින් ඉදිරියේදී කිසිම අයුරකින් සමිති විසින් කර ඇති විනය පරීක්ෂණ නිලධාරීන්ගේ පත්කිරීම් විධිමත් නොකරන බවත් කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දැනුම් දෙමි.

කේ.ජේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
01. බස්නාහිර පළාතේ සමුපකාර හා පළාත්මාර්ග අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
02. ප්‍රධාන ලේකම් (බ.ප.)
03. ලේකම්, සමුපකාර හා පළාත්මාර්ග අමාත්‍යාංශය (බ.ප.)
04. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් (බ.ප.)
05. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
06. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව,
07. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
08. සියළුම වෘත්තීය සමිති සංගම්